## රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

## දේශීය ණය සහ සංවර්ධන අරමුදල

# පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවීම

දිවයිනේ පළාත් පාලන ආයතනවල ප්‍රාග්ධන ආයෝජනය සහ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය ණය පහසුකම් සැපයීම සහ ණය ආපසු අයකිරීමේ ප්‍රධාන කාර්යභාරය ඉටුකරන දේශීය ණය සහ සංවර්ධන අරමුදල වර්ෂ 1916 අංක 22 දරන ආඥා පනත යටතේ පිහිටුවන ලද ව්‍යවස්ථාපිත ආයතනයක් වන අතර මෙම අරමුදල රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය යටතේ පාලනය වේ. මෙම ආයතනයේ පහත සඳහන් තනතුරේ ඇබෑර්තුව සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**රියදුරු**

**(පුරප්පාඩු සංඛ්‍යාව - (01)**

**01. සේවා ගණය :**

"ප්‍රාථමික - ශිල්පීය"

**02. සේවා ගණයට පැවරෙන කාර්යයන්හි ස්වභාවය පිළිබඳ පොදු නිර්වචනය**

ආයතනයක් වෙත පැවරෙන කාර්යයන් ඉටු කිරීම හා පවත්වාගෙන යාම සඳහා වන මූලික අවශ්‍යතාවන් වන ඉදිකිරීම්, නඩත්තු, අලුත්වැඩියා, ආලෝකනය වැනි මූලික කාර්යයන් අතුරින් තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතා (N.V.Q.) හතර (4) වැනි මට්ටමේ කාර්මික පුහුණු සහතිකයක් / ප්‍රවීණතා සහතිකයක් මඟින් තහවුරු කෙරෙන කාර්මික / ශිල්පීය / වෘත්තීය කුසලතාවන් අවශ්‍ය වන කාර්යයන් පවරනු ලබන තැනැත්තන්ගෙන් සහ ප්‍රවාහන කාර්යයන්හි දී අවශ්‍ය වන, මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කෙරෙන මෝටර් රථ රියැදුරු බලපත්‍රයක් දරන තැනැත්තන්ගෙන් සමන්විත සේවා ගණයකි.

**03. සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් සඳහා**

**අධ්‍යාපන සුදුසුකම් :**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකින් යටත් පිරිසෙයින් සම්මාන දෙක (02) ක් සහිතව විෂයයන් හය (06) කින් සමත් වීම

**සහ**

**ප්‍රවීණතා :**

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ බර වාහන පැදවීම සඳහා වූ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම සහ රියදුරු බලපත්‍රය ලැබීමෙන් පසු රිය පැදවීම සම්බන්ධයෙන් අවම වශයෙන් වසර තුන (03) ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා :-**

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ බර වාහන පැදවීම සඳහා වූ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම සහ රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසු රිය පැදවීම සම්බන්ධයෙන් අවම වශයෙන් වසර තුන (03) ක පළපුරුද්දක් ලබා තිබීම.

**සහ**

ප්‍රාථමික ශිල්පීය නොවන (PL 1) සේවා ගණයක වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණකර තිබීම.

**04. වයස් සීමාව**

අවු : 18 ට නොඅඩු හා අවු : 45 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවකුට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

මෙම තනතුර කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලැබූ බඳවා ගැනීමේ සහ උසස්වීම් පරිපාටිය අනුව අනුමත තනතුරකි.

සේවා ගණයට අදළ කේත අංකය හා මාසික වැටුප් පරිමාණය *

2025.01.01 දින සිට,

PL3 රු. (43,280 - 10 X 490 - 10 X 540 - 10 X 590 - 12 X 630 - 67,040)

(රජයේ අනුමත දීමනා එකතුවේ)

ප්‍රධාන කාර්යාලයේ සේවය සඳහා බඳවා ගන්නා බැවින් ආසන්න පදිංචි අයදුම්කරුවන් හට ප්‍රමුඛතාවය හිමි වේ.

බඳවාගැනීම සම්මුඛ පරීක්ෂණයක් මගින් සිදුකෙරේ.

**සේවා කොන්දේසි**

i. මෙම තනතුරු ස්ථිර වන අතර වසර 03 ක පරිවාස කාලයකට යටත්වේ.

ii. සේවක අර්ථ සාධක අරමුදල සඳහා සේවකයා විසින් වැටුපෙන් 8% ක් ගෙවිය යුතු අතර සේව්‍යයා විසින් 12% ක් සහ සේවක භාරකාර අරමුදල සඳහා 3% ක් ද ගෙවනු ලැබේ.

අයදුම්පත් ප්‍රධාන විධායක නිලධාරී, දේශීය ණය සහ සංවර්ධන අරමුදල, අංක 24 /ඒ, වෝඩ් පෙදෙස, කොළඹ 07 යන ලිපිනයට 2025.09.26 දිනට හෝ ඊට පෙර ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පතේ ඉහළ කෙළවරේ අදාළ තනතුර සඳහන් කළ යුතුය.

**සභාපති,**
**දේශීය ණය සහ සංවර්ධන අරමුදල.**